**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත්වර්ෂයට අදාළ රු.466,627 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දි ඇති කරුණු පිළිගනිමි.ඉදිරියේදි මෙවැනි වැරදි නොවීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි අයිතම 24 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පවරාගැනීම් සිදුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | පවරා ගැනිමට කටයුතු කරමින් පවති. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා ප්‍රා.ස. 07 වාර්තාව අනුව ශේෂ අතර රු. 254,509 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය සහ ප්‍රාස 07 ආකෘතිය අතර හිඟ කඩ කුලි අතර වෙනස රු. 233,740 ක් වි ඇත්තේ ප්‍රා ස 07 තුළ කඩ කුලිය බිල් කිරිම හේතුවෙනි. මූල්‍ය ප්‍රකාශනය සහ ප්‍රාස 07 ආකෘතිය අතර හිඟ වරිපනම් වෙනස රු. 20,768.97 වී ඇත්තේ වට්ටම් අඩු නොවි පැවතිමයි. |
| (ඇ) | වටිනාකම රු. 337,414,510 ක් වූ ගිණුම් ශේෂයන් 09 කට අදාලව ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි | ස්ථාවර වත්කම් ලේඛන පවත්වන අතර සමීක්ෂණ වාර්තා ඉදිරියේදී ඉදිරිපත් කරමි. ඇතැම් ශේෂ දීර්ඝ කාලයක සිට |

විගණනයේදී ඒවා සතුටුදායක ලෙස ඉදිරිපත් කළ යුතු වේ. පැවත එන සාක්ෂි නොමැති ශේෂ වේ. සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 152(4) | 2018 වර්ෂය සඳහා ව්‍යාපාර 108 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැර ඇති අතර එකී පාර්ශවයන්ට විරුද්ධව නීති මඟින් කටයුතු කර නොතිබුණි. | නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 193 වගන්තිය | එක් එක් ආදායම් හා වියදම් විෂයය යටතේ වන අතිරික්තයන් හා ඉතිරිවීම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) | 206 වගන්තිය | සමීක්ෂණ මණ්ඩල වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රීති වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (iii) | 218 වගන්තිය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. | රීති වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණ කටයුතු සිදුකර ඇත. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.80,054,719 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.85,900,111 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31දිනට මුළුහිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 6,364,500 | 7,207,376 | 2,159,213 | 6,053,997 | 11,846,000 | 6,304,156 | 6,303,000 | 5,621,253 |
| II. | බදු කුලී | 13,885,000 | 12,618,065 | 14,453,535 | 2,009,928 | 19,183,000 | 16,143,033 | 16,141,000 | 3,043,360 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,850,000 | 1,316,105 | 1,316,105 | - | 2,005,000 | 2,005,938 | 2,005,000 | - |
| IV. | වෙනත් ආදායම් | 162,694,500 | 188,177,605 | 83,785,985 | 119,717,928 | 286,897,000 | 173,146,762 | 173,147,000 | 113,674,347 |
| | එකතුව | 184,794,000 | 209,319,151 | 101,714,838 | 127,781,853 | 319,931,000 | 197,599,889 | 197,596,000 | 122,338,960 |

**2.2.2** **වරිපනම් බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 5,146,907 ක් අයවීමට තිබුණි. ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) (ආ) හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-43 ප්‍රකාරව කටයුතු නොකිරීම මත මෙම හිගය වර්ධනය වෙමින් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් රැස් කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2.3** **බදු කුලී හා කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබෙන හිඟ බදු කුලී ශේෂය රු.1,806,898 ක් විය. | ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ගෙවීම පැහැර හැරීමේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් නීති මාර්ගයෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර අයකර ගැනීමට නොහැකි ශේෂ කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වෙමි. |

**2.2.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ හිඟය හා මුද්දර ගාස්තු හිඟ පිළිවෙලින් රු. 4,950,875 ක් සහ රු.109,000,000 ක් වූ අතර, එම ශේෂයන් තුළ මුද්දර ගාස්තු අධි ඇස්තමේන්තු කිරීමක් සිදු කර තිබුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු කොපමණ දැයි ස්ථිරවම දැක්විය නොහැකි බැවින් ඇස්තමේන්තු මුදලක් ලෙස මුද්දර ආදායම ගිණුම් ගත කර ඇත. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව 2017 වර්ෂයේ රු 693,412 ක් වැයකර ඉදිකළ හිරිපිටිය මාළු වෙළඳසැල් ගොඩනැගිල්ල අදාළ කාර්යයට යොදාගැනීමට නොහැකි වී තිබුණු අතර වෙනත් ව්‍යාපාරික කටයුත්තක් සඳහා ලබා දීමට හෝ කටයුතු කර නොතිබුණි. | දේපල පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වේ. | පිළි ගනිමි. මාළු හෝ මස් කඩ සඳහා පමණක් මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති බැවින් ඒ සඳහා තෙවරක් ටෙන්ඩර් කළත් කිසිවෙකු ඉදිරිපත් වූයේ නැත. |

### 3.2 කළමනාකරණ අකාර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.85,534,685 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබෙන රු.16,994,031 ක ණය හිමි ශේෂයක්ද වසර 03 ට වඩා වැඩි කර්මාන්ත ණය හිමියෝ රු.1,159,893 ක් ද වසර 05 ට වඩා වැඩි වැට් බදු රු.554,271 ක් ද, විශ්‍රාම අරමුදල් රු.4,052,433 ක් ද විය. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ගෙවීමට හෝ හිලව් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | බතලගොඩ ළමා උද්‍යානයේ රු. 1,294,439 ක් වැයකර ඉදිකර තිබූ කිරිහලක් 2019 පෙබරවාරි 13 වන විටත් කිසිදු බැදීමකින් හා | නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ටෙන්ඩර් කළත් එය කිසිවෙකු විසින් ලබාගත්තේ නැති බව කාරුණිකව දැනුම් දෙමි. |

ගාස්තුවකින් තොරව පෞද්ගලික පාර්ශවයකට පවත්වාගෙන යාමට ඉඩ දී තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 16 ක් පැවතුණි. | අනුමත කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් පරීක්ෂක, පෙර පාසල් ගුරු, කළමනාකරණ සහකාර යන තනතුරු පුරප්පාඩු සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බඳවා ගැනිම් කළ යුතුය. මාර්ග කම්කරු පුරප්පාඩු සඳහා බඳවා ගැනිමට කටයුතු කරමින් පවතී. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.2 ඡේදයට පටහැනිව පළාත් පාලන මාර්ග ඉදිකිරීමේදී මෙන්ම වැඩි දියුණු කිරීමේදී ඒවා කල් පවත්නා අයුරින් පවත්වා ගැනීම සඳහා කාපට් කිරීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම කළ යුතු වුවද, 2018 වර්ෂයේ මාර්ග 38 ක් සඳහා රු.12,172,648 ක් වැයකර බොරළු යොදා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මන්ත්‍රීවරු 22 සිට 43 දක්වා වැඩිවීම නිසා කොට්ඨාශ සංවර්ධනය කිරිමට දක්වන කැමැත්ත නිසා බල ප්‍රදේශය විශාලවීමත් මාර්ග පද්ධති අධිකවීමත් මහජන ඉල්ලීම් මත චක්‍රලේඛය අභිබවා යාමට සිදු විය. |
| (ආ) | ලේනව තට්ටාවල අතුරු මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක 01,02,03 යටතේ ඝන මීටර් 425 බොරළු සපයා ගොනුකර මිලි මීටර් 150 ක් ඝනකමට මාර්ගයේ ඇතිරීමට රු.859,775 ක් ගෙවා තිබුණද, ස්ථාන 22 ක් අඟල් 4x4 පමණ වලවල් හාරා පරීක්ෂාවේදී බොරළු ඇතිරීම මි.මී.50 ක් පමණ විය. ඒ අනුව මාර්ගයට අතුරා ඇති බොරළු ප්‍රමාණය | ඉදිකිරීම් කටයුතු විධිමත්ව ඉටු කළ යුතු වේ. | පිළිගෙන ඇත. අධික බරින් යුත් වාහන අධික ලෙස සංසරණය වීමෙන් මතුපිට බොරළු ඝෂ්ඨයේ ඝණකම ක්‍රමයෙන් අවම මට්ටමකට පත්වීමත් සිදුවිය. |

| | | | |
|---|---|---|---|
| | සන මීටර් 142 (50/150x425) වූයෙන් රු.507,509 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඇ) | මැල්සිරිපුර ආදාහනාගාරයේ වහලයේ තීන්ත ආලේප කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක 01 හා 02 යටතේ එක් වරක් ප්‍රාථමික ආලේපයක්ද, සමඟ දෙවරක් දේශගුණික තත්වයට ඔරොත්තු දෙන එමල්ෂන් තීන්ත ආලේපයට වර්ග මීටර් 503.75 ක් සඳහා රු. 312,314 ක් ගෙවා තිබුණද, භෞතික පරීක්ෂාවේදී එම කර්මාන්තයට අදාළ කාර්යාල ගොඩනැගිල්ලේ හා මුරකුටියෙහි වහලයේ ප්‍රාථමික ආලේපයකින් තොරව තීන්ත ආලේප කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු විධිමත්ව ඉටු කළ යුතු වේ. | රැඳවුම් මුදල් නිදහස් කිරීමට ප්‍රථම ඒවැනි වැඩ විෂයන් කෙරෙහි වැඩි අවධානයක් යොමුකර අඩුපාඩු සකස් කරමි. |